# බුද්ධ ධර්මය

## 1 ශ්‍රේණිය



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# 24 පාඩම
# හිංසාව හොඳ නැහැ



මේ පාඩම්වලින් ඔබේ දරුවාට යහපත් පෞරුෂයක් ගොඩනගා ගැනීමට අවශ්‍ය පදනම ලබාදීමට අපේක්ෂා කෙරේ.

අන්තර්ගතය :- දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
පරිගණක පිටු සැකසුම :- ඒ.එම්.එස්. උත්පලා ගුණවර්ධන - පු/සාන්ත ඇන්ඩෲ මධ්‍ය මහා විද්‍යාලය පුත්තලම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

**දෙමව්පියනි/වැඩිහිටියනි,**

බුද්ධ ධර්මය 1 ශ්‍රේණිය පෙළ පොත භාවිත කරමින් දරුවා මෙම ක්‍රියාකාරකම් වල නිරත කරවන්න. දුෂ්කරතා දැක්වුවහොත් දරුවාට උදව් කරන්න.

## ක්‍රියාකාරකම 1

- මෙම පින්තූරවල දැක්වෙන දේ වැඩිහිටියෙකුට පවසන්න.

අංක 1



අංක 2



අංක 3



අංක 4





Copyright © www.e-thaksalawa.moe.gov.lk

බුද්ධ ධර්මය

1 ශ්‍රේණිය

## ක්‍රියාකාරකම 2

- වැඩිහිටියනි, මේ පුංචි කතාව දරුවාට කියා දෙන්න.

සිදුහත් කුමාරයාට යාළුවෝ ගොඩක් හිටියා. එක යාළුවෙක් තමයි දෙව්දත් කුමාරයා. දවසක් හැමෝම උයනට ක්‍රීඩා කරන්න ගියා. දෙව්දත් කුමාරයා පියඹා යන හංසයෙකුට දුන්නෙන් විදලා බිම දැම්මා. සිදුහත් කුමාරයාට හංසයා ගැන දුක හිතිලා හංසයා වැටුණු තැනට ඉක්මනින් ගියා. ඊතලය ඉවත් කරලා හංසයාට බෙහෙත් කළා. සිදුහත් කුමාරයා හංසයා සුවපත් කළා. සිදුහත් කුමාරයා සතුන්ට හරි ම කරුණාවන්තයි. බොදු දරුවන් වන අපි සතුන්ට කරුණාව දක්වමු.

## ක්‍රියාකාරකම 3

❖ බොදු දරුවන් වන අපි පන්සිල් ගනිමු.

❖ පළමු සිල් පදය කියමු.

**පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි**

**“මම පණ ඇති සතුන් මැරීමෙන් වළකිමි”**

- පළමු ව මෙය කියවන්න.
- දෙවනු ව ඇස් පියාගෙන කියන්න.
- තුන්වෙනු ව සිතින් කියවන්න.
- හතරවෙනු ව සිතන්න.

❖ බලන්න මේ පියවර හතර ඔබටත් කරන්න පුළුවන්ද කියලා.

## ක්‍රියාකාරකම 4

- මේ පෙරහැරේ යන සත්තු කියන්නෙ මොනවාද බලමු.




- වැඩිහිටි උදවු ලබා ගනිමින් ඉහත පාඨ කියවන්න.

## ක්‍රියාකාරකම 5

- 24 පාඩමෙ 47 පිටුවේ ඇති කවිය කියවන්න.
  - ✓ පළමු ව වචන කියවන්න.
  - ✓ දෙවනු ව තාලයට ගයන්න.
- කවියේ කියවෙන සතුන්ගේ රූප සොයා අලවන්න.
- එම රූප බලා අඳින්න.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

- ඔබ සතුන්ට උදවු කළ අවස්ථාවක් දැක්වෙන චිත්‍රයක් අඳින්න.

### ක්‍රියාකාරකම 6

1) ඔබ සතෙකුට උපකාර කරන අයුරු දැක්වෙන චිත්‍රයක් ඇඳ අපතේ යන දේවල් වලින් එම චිත්‍රය අලංකාරව අලවන්න. (වේලුණු මල් කොළ/ බීජ වර්ග/ අපතේ යන වර්ණ කඩදාසි ආදී..)

2) කිසි ම සතකු නොපෙළන්න පුතේ
කටුස්සකුට හූනකු හට වත්
ලේනකු බළලකු මොකකුට වත්
හිංසාවක් නොම කරන් පුතේ

මෙම කවියේ සඳහන් සතුන් තිදෙනෙකුගේ (3) නම් කියන්න.

- "සත්තු අපේ මිතුරෝ ය. "මාතෘකාව යටතේ චිත්‍රයක් අඳින්න.

අන්තර්ගතය :- දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පරිගණක පිටු සැකසුම :- ඒ.එම්.එස්. උත්පලා ගුණවර්ධන - පු/සාන්ත ඇන්ඩෲ මධ්‍ය මහා විද්‍යාලය පුත්තලම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

3) ගැළපෙන සේ යා කරමු.

| | |
|---|---|
| සත්තු අපේ | රැක ගනිමු. |
| සතුන්ට හිංසා කරන්න | යහළුවෝය. |
| අපි සතුන් ආදරයෙන් | හොඳ නැහැ. |

4) යා කරන ලද ඉහත වැකි කාඩ්බෝඩ් කැබලි තුනක තරමක් ලොකුවට ලියා පන්ති කාමරයේ ඇති ආදර්ශ වැකි ඇතුළත් ගස සැරසීමට රැගෙන යමු.

5) බුද්ධදාස රජු අසරණ වූ නාගයාට උපකාර කළ කතාව/ ගැරඬියකුට හිරිහැර කළ දරුවන් පිරිසකට බුදු හිමියන් අවවාද කර එම ගැරඬියා මුදා ගත් කතාව දෙමවුපියන්ගෙන් හෝ නිවසේ සිටින වැඩිහිටි අයෙකුගෙන් අසා දැන ගනිමු. ඔබ දැනගත් කතාවේ කැමතිම අවස්ථාව ඇඳ පාට කරමු.

හරිම හොඳයි.  ✓



Copyright © www.e-thaksalawa.moe.gov.lk